**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය 2010**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | ශ්‍රී.ලං.ගි.ප්‍ර | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 09 | මාස 3 ට වැඩි ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස පෙන්විය යුතු වුවද රු. 623,500 ක ස්ථාවර තැන්පතු හා නැවත ආයෝජනය කළ ඊට අදාල පොලිය ව රු. 24,487 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. |
| (ආ) | 12 | ශේෂ පත්‍ර දිනට පසුව දෙන ලද අධිකරණ තීන්දුවක් අනුව මධ්‍යස්ථානයට රු. 589,406 ක් ගෙවීමට සිදුවී තිබූ අතර, ඒ සම්බන්ධව හෙළි දරව් කිරීම හා ගැලපීම් සිදු කර නොතිබුණි. |
| (ඇ) | 16 | සේවක පාර්තෝෂික ගෙවීම සඳහා රු. 56,883,940 ක මුදලක් වෙන්කර තිබුණද එම මුදල සඳහා ආයෝජනයක් කර නොතිබුණි. |
| (ඈ) | 36 | මධ්‍යස්ථානයට විරුද්ධව සේවකයන් දෙදෙනෙකු විසින් පවරන ලද නඩු දෙකක් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගණනය කිරීමේදී රු. 339,155 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) තොග ඌණතාවය වූ රු. 15,549 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරණ ලැබේ.

(අ) i. රු. 10,632,988 ක වෙළඳ ණයගැතියෝ හා වෙනත් ලැබිය යුතු ශේෂ අතුරින් රු. 5,560,695 ක ශේෂ වර්ෂ 05 ට වැඩි වූ අතර, අවුරුදු 3-5 ත් අතර ශේෂ රු. 215,013 ක් ද, අවුරුදු 1-3 ත් අතර ශේෂ රු. 397,572 ක් ද, වූ අතර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. රු. 2,881,029 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුල අවුරුදු 4 ට වැඩි ශේෂ රු. 296,099 ක් ද, අවුරුදු 2-4 ත් අතර ශේෂ රු. 26,117 ක් ද, අවුරුදු 1-2 ත් අතර ශේෂ රු. 234,093 ක් ද වූ අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශේෂපත්‍ර දිනට රු. 7,359,827 ක් වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුල අවුරුදු 04 ට වැඩි රු. 539,673 ක් ද, අවුරුදු 2-4 ත් අතර රු. 458,195 ක් ද, අවුරුදු 1-2 ත් අතර රු. 274,981 ක් ද, නිරවුල් නොවී පැවතුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කරගත හැකි රු. 25,387,601 ක් වූ එකතු කල අගය මත බදු මුදල දීර්ඝ කාලයක සිට අය නොවී පැවතුණි.

(ඈ) සාවද්‍ය වැටුප් පරිවර්තනයක් අනුව වැඩිපුර ගෙවා ඇති රු. 145,915 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඉ) මූලාා ප්‍රකාශන වල දක්වා ඇති රු. 10,084,581 ක් වන ණය ගැති ශේෂ හා රු. 2,826,437 ක් වන ණයහිමි ශේෂ සඳහා අදාල පාර්ශවයන් විසින් ශේෂ සනාථ කිරීම් සිදුකර නොතිබුණු හෙයින් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයට නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තිරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය | 2008, 2009 වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි (මු.රෙ)</u><br>මු.රෙ. 271(2) (ආ) | නොගෙවන ලද වැටුප් හා වේතන දින 14 ක කාලයක් අවසානයේ අධිභාර ගිණුමට, ආදායමට හෝ වෙනත් නියමිත ගිණුමකට බැරකල යුතු වුවත් රු. 63,956 ක නොගෙව වැටුප් හා වේතන සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය සමාලෝචනය

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 3,902,794 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 18,279,718 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 14,376,924 ක වර්ධනයක් ඇතිවීම සඳහා මුළු ආදායම රු. මිලියන 6 කින් වැඩිවීම, පර්යේෂණ හා සංවර්ධන වියදම් රු. මිලියන 6 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු. මිලියන 4 කින් අඩුවීම බලපා තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

2.2.1 භෞතික කාර්ය සාධනය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1983 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හඳුන්වාදී ඇති මුළු තාක්ෂණික උපකරණ සංඛ්‍යාව 43 ක් වූ අතර එයින් පේටන්ට් බලපත්‍ර අළුත්කර ගෙන තිබුණේ උපකරණ 18 කට පමණි.

(ආ) වසර 17 ක කාලයක් තුල නිර්මානය කරන ලද තාක්ෂණික උපකරණ 43 ක් සුළු කර්මාන්ත කරුවන් 897 දෙනෙකුට එම කාලපරිච්ඡේදය තුල හඳුන්වාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂයතුල බලපත්‍ර අළුත්කර තිබුණේ එයින් කර්මාන්ත කරුවන් 82 දෙදෙනෙකු පමණි.

(ඇ) මධ්‍යස්ථානයේ වර්ෂ 5 ක පර්යේෂණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| | ------ | ------ | ------ | ------ | ------ |
| අපේක්ෂිත පර්යේෂණ | 28 | 28 | 23 | 23 | 24 |
| අවසන් කරන ලද පර්යේෂණ | 14 | 08 | 08 | 15 | 18 |
| අත්හැර දමන ලද පර්යේෂණ | 02 | 06 | 03 | 03 | - |
| ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණ | 03 | 07 | 08 | 03 | 05 |
| භාවිතයට ගනු ලබන පර්යේෂණ | 07 | 07 | 05 | 09 | 04 |

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ව ක්‍රියාකාර් සැලැස්මේ ඉලක්ක ගත අරමුණු කරා ලඟාවීමට නොහැකි වූ අවස්ථා පහත දැක්වේ.

| | ඉලක්කය | | තථ්‍ය කාර්ය සාධනය |
|---|---|---|---|
| | ---------- | | ---------------------- |
| i. | බලපත්‍ර 15 ක් ලබාදීම. | - | බලපත්‍ර ලබාදී නැත |
| ii. | විද්‍යාතා මධ්‍යස්ථාන 4 ක් පිහිටුවීම. | - | මධ්‍යස්ථාන 2 ක් පමණක් පිහිටුවා ඇත. |
| iii | භාහිර පාර්ශවයන් සමඟ සාකච්ජා කිරීම. | - | සාකච්ජා 2 ක් පවත්වා ඇත. |

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තේ වියලීමේ යන්ත්‍ර සඳහා ඩීසල් වෙනුවට දර භාවිතා කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ගිවිසුමට අනුව සවිකිරීම් හා පරීක්ෂණ (Commissioning and testing) අවස්ථාවේ වන සෘජු වියදම් අදාල සමාගම සමඟ සමාන ප්‍රතිශතයකින් වැය කළ යුතු වුවත්, ව්‍යාපෘතියේ මුළු පිරිවැය වූ රු. 5,063,200 ක් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් වැය කර තිබුණි. නියමිත දිනට ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ අතර, පේටන්ට් අයිතිය ලබාගැනීමට හෝ තාක්ෂණය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ 05 ක කාලය තුල රු. 1,974,893 ක පිරිවැය ව පර්යේෂණ 14 ක් අත්හැර දමා තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ ආරම්භකල අංක ආර්ඊඩී/ආර්ඊඑස්/114/07 දරන ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා විදේශ ගතවීම හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණ අතර, ඒ සඳහා මෙතෙක් වැය කල මුදල රු. 267,217 ක් විය.

(ඈ) දර වායු ජනකයක් මගින් ක්‍රියාත්මක වන කි.වො. 100 විදුලි උත්පාදන පද්ධතියේ නිර්මාණ කටයුතු 2002 වර්ෂයේදී අවසාන කිරීමට නියමිතව තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 22,106,616 ක් වැය කර තිබුණද, ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට මෙතෙක් හැකිවී නොතිබුණි. තවද, මෙයින් ජනනය වන විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා 2004 වර්ෂයේ සිට රු. 8,955,343 ක් වැය කලද, එම කටයුතු සිදුකර නොතිබුණි.

2.2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ව්‍යාපෘතිය | නිරීක්ෂණය |
|---|---|
| (i) ඩෙන්ඩ්‍රෝ ව්‍යාපෘතිය | 2003 දෙසැම්බර් 29 දින ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබී තිබුණු රු.2,660,000 ක මුදල භාවිතයට නොගෙන වසර 07 කට පසු 2010 සැප්තැම්බර් 16 දින අමාත්‍යාංශයට ආපසු යවා තිබුණි. |
| (ii) ICAMS ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2003 වර්ෂයේදී ලැබුණු රු.2,639,232 ක මුදල ජංගම ගිණුමෙහි රඳවා තබාගෙන සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කර තිබුණි. |
| (iii) කි.වො. 10 ක විදුලිය ලබාදීම. | 2006 වර්ෂයේ අවසන් වීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.4,535,228 ක වැය කර තිබුණද එහි වැඩ 2011 ජුනි 06 වන විටත් නිම කර නොතිබුණි. |
| (iv) ද්විත්ව පහර ත්‍රීරෝද රථයක් විදුලි මෝටරයකින් ක්‍රියාකරවීමේ ව්‍යාපෘතිය. | 2007 වර්ෂයේදී නිම කළයුතු මෙම ව්‍යාපෘතිය සඳහා රු. 1,221,364 ක් වැය කර තිබුණද එහි වැඩ 2011 ජුනි 06 වන විටත් නිමකර නොතිබුණි. |

2.2.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මුළු තොගයෙන් රු. 3,973,122 ක් (28% ක්) චලනය නොවන තොග ලෙස අවුරුදු 06 කට වඩා වැඩි කාලයක සිට ගබඩාවේ පැවතුණි.

ii. විකුණුම් මධ්‍යස්ථානයක් සඳහා මිලදී ගත් රු. 69,720 ක් වටිනා ලී බඩු හා විවිධ අංශ වෙනුවෙන් මිලදී ගත් රු. 61,579 ක් වටිනා භාණ්ඩ ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

2.2.5 හඳුනාගත් පාඩු

------------------

සමාලෝචිත වර්ෂයේදී නිමකල ව්‍යාපෘති 17 ක තාක්ෂණික පැවරීම් ආදායමට වඩා ඒවායේ පිරිවැය වැඩිවීම හේතුවෙන් රු. 1,525,279 ක අලාභයක් සිදු වී තිබුණි.

2.2.6 සංයුක්ත සැලැස්ම

--------------------

2009 - 2011 කාලපරිච්ඡේදයට අදාලව ආයතනය විසින් සකස් කල සංයුක්ත සැලැස්ම 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදයේ විධි විධාන ප්‍රකාරව සකස් කර නොතිබුණි.

2.2.7 විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම

--------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 හා 7.4.2 ඡේද ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් අවුරුද්දකට හතර වරක්වත් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල රැස්වීම් පවත්වා තිබුණේ එකක් පමණී.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිවෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ව්‍යාපෘති පිරිවැයකරණය හා කළමනාකරණය
(ආ) තොග පාලනය
(ඇ) ණයගැති සහ ණයහිමි පාලනය
(ඈ) මිලදී ගැනුම්
(ඉ) ගබඩා පාලනය